# 16. චෙතොඛිල සූත්‍රය.

1. මා වසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු මහ සිටුහුගේ ජෙතවනාරාමයෙහි වැඩ වාසය කරණ සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ, "මහණෙනි"යි, කියා භික්ෂූන්ට ආමන්ත්‍රනය කළහ. ' ස්වාමීනියි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

" මහණෙනි, යම් කිසි භික්ෂුවක් විසින් සිත බැඳී පවත්නා කුණු වැනි හෙයින් චෙතොඛිල නම්වූ ධර්ම පහක් පහනොකරන ලද්දාහුද හිත සම්බන්ධවූ බැම් පසක් නොසිඳන ලද්දාහුද ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් මේ ශාසනයෙහි අභිවෘධියටද, වැඩීමටද මහත් බවටද පැමිණෙන්නේය, යන මේ කාරණය සිදු නොවෙයි. ඔහු විසින් පහ නොකරන ලද චෙතොඛිලධර්ම පස කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි, මහණතෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කරයිද, අවිශ්වාස කරයිද මෙස් මෙසේ යයි නිශ්වයට නොපැමිණේද නොපහදීද මහණෙනි, යම් ඒ භික්ෂුවක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැකකෙරේද, විශ්වාස නොකෙරේද, නිශ්වයට නොපැමිණේද නොපහදීද ඒ භික්ෂූහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් පළමුවන චෙතොඛිල ධර්මය පහ නොකරන ලද්දේ වෙයි.

2. " මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම ධර්මය සැක කෙරේද අවිශ්වාස කරයිද මෙසේ මෙසේ යයි නිශ්වයට නොපැමිණේද නෙපහදීද මහණෙනි, යම් භික්ෂුවක් ධර්මයෙහි සැකකෙරේද අවිශ්වාස කරයිද මෙසේ මෙසේ යයි නිශ්වයට නොපැමිණේද නොපහදීද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යය කිරීම පිතිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යය කිරීම පිණිස වීර්‍ය්‍යය පිහිටුවීම පිණිස නොනැමෙයි, යමකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යකිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්‍ය්‍යකිරීම පිණිස, වීර්‍ය්‍යය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් දෙවෙනි චෙතොඛිල ධර්මය පහ නොකරන ලද්දේ වෙයි.

3. " මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම සංඝයා කෙරෙහි සැකකෙරේද, අවිශ්වාස කරයිද, මෙසේ මෙසේ යයි නිශ්වයට නොපැමිණේද, නොපහදීද මහණෙනි, යම් ඒ භික්ෂුවක් සංඝයා කෙරෙහි සැක කෙරේද? අවිශ්වාස කරයිද, මෙසේ මෙසේ යයි නිශ්වයට නොපැමිණේද,

නොපහදිද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යී කිරීම පිණිස එම වීර්‍ය්‍යීයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යීකිරීම පිණිස වීර්‍ය්‍යීය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් තුන්වැනි චෙතොඛිල ධර්‍මය පහ නොකරන ලද්දේ වෙයි.

**4.** " මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම ත්‍රිවිධ ශික්‍ෂාව කෙරෙහි සැක කෙරේද, අවිශ්වාස කෙරේද, නිශ්වයට නොපැමිණේද, නොපහදිද, මහණෙනි, යම් ඒ භික්‍ෂුවක් ත්‍රිවිධ ශික්‍ෂාව කෙරෙහි සැකකෙරේද, අවිශ්වාස කෙරේද, නිශ්වයට නොපැමිනේද, නොපහදිද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යීකිරීම පිණිස එම වීර්‍ය්‍යීයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යී කිරීම පිණිස, වීර්‍ය්‍යී පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යී කිරීම පිණිස එම වීර්‍ය්‍යීයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යී කිරීම පිණිස වීර්‍ය්‍යී පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් සතර වැනිවූ චෙතොඛිල ධර්‍මය පහ නොකරන ලද්දේ වෙයි.

**5.** " මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම සබ්‍රම්සරුන් (එකට මහණ දම් පුරණ භික්‍ෂුන්) කෙරෙහි කිපියේ නොසතුටු සිත් ඇත්තේ තරහයෙන් මැඩුනු සිත් ඇත්තේ තද ගතියෙන් යුක්ත වූයේ වේද, මහණෙනි, යම් ඒ භික්‍ෂුවක් සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නොසතුටු සිත් ඇත්තේ තරහයෙන් මැඩුනු සිත් ඇත්තේ තද ගතියෙන් යුක්ත වූයේ වේද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යීකිරීම පිණිස එම වීර්‍ය්‍යීයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යී කිරීම පිණිස, වීර්‍ය්‍යී පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යී කිරීම පිණිස එම වීර්‍ය්‍යීයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යී කිරීම පිණිස වීර්‍ය්‍යී පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් මේ පස් වැනි චෙතොඛිල ධර්‍මය පහ නොකරන ලද්දේ වෙයි. ඔහු විසින් මේ චෙතොඛිල ධර්‍ම පස පහ නොකරන ලද්දාහු වෙත්.

**6.** " ඔහු විසින් කවර නම් සිත පිලිබඳ බැම් පසක් නොසිඳින ලද්දාහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයෙහි පහ නුවූ ආශාව ඇත්තේ වේද, පහ නෙවූ කැමැත්ත ඇත්තේ වේද පහ නුවූ ප්‍රේමය ඇත්තේ වේද පහ නොවූ පිපාසය ඇත්තේ වේද පහ නුවූ දැවිල්ල ඇත්තේ වේද පහ නුවූ තෘෂ්නාව ඇත්තේ වේද මහණෙනි, යම් මේ මහණෙක්තෙම කාමයේ පහ නුවූ ආශාව ඇත්තේ වේද, පහ නුවූ කැමැත්ත ඇත්තේ වේද, පහ නුවූ ප්‍රේමය ඇත්තේ වේද පහ නොවූ පිපාසය ඇත්තේ වේද පහ නුවූ දැවිල්ල ඇත්තේ වේද පහ නුවූ තෘෂ්නාව ඇත්තේ වේද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යීය කිරීම පිණිස එම වීර්‍ය්‍යීයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යී කිරීම පිණිස, වීර්‍ය්‍යී පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යී කිරීම පිණිස එම වීර්‍ය්‍යීයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යී කිරීම පිණිස වීර්‍ය්‍යී පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් මේ පළමුවෙනි සිත පිලිබඳ බැම්ම නොසිඳින ලද්දේ වේ.

**7.** " මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම තමන්ගේ කයෙහි පහ නුවූ ආශාව ඇත්තේ වේද පහනොවූ කැමැත්ත ඇත්තේ වේද පහ නුවූ ප්‍රේමය ඇත්තේ වේද පහ නොවූ පිපාසය

ඇත්තේ වේද පහ නුවූ දැවිල්ල ඇත්තේ වේද පහ නුවූ තෘෂ්ණාව ඇත්තේ වේද මහණෙනි, යම් මේ භික්ෂුවක් තමන්ගේ කයෙහි පහ නුවූ ආශාව ඇත්තේ වේද, පහ නුවූ කැමැත්ත ඇත්තේ වේද, පහ නුවූ ප්‍රේමය ඇත්තේ වේද පහ නොවූ පිපාසය ඇත්තේ වේද පහ නුවූ දැවිල්ල ඇත්තේ වේද පහ නුවූ තෘෂ්ණාව ඇත්තේ වේද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස, වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් මේ දෙවෙනි සිත පිලිබඳ බැම්ම නොසිඳින ලද්දේ වේ.

**8.** " මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම තමාගෙන් අන්‍යවූ රූපයෙහි පහ නුවූ ආශාව ඇත්තේ වේද පහනොවූ කැමැත්ත ඇත්තේ වේද පහ නුවූ ප්‍රේමය ඇත්තේ වේද පහ නොවූ පිපාසය ඇත්තේ වේද පහ නුවූ දැවිල්ල ඇත්තේ වේද පහ නුවූ තෘෂ්ණාව ඇත්තේ වේද මහණෙනි, යම් ඒ මහණෙක් තමාගෙන් අන්‍යවූ රූපයෙහි පහ නුවූ ආශාව ඇත්තේ වේද, පහ නුවූ කැමැත්ත ඇත්තේ වේද, පහ නුවූ ප්‍රේමය ඇත්තේ වේද පහ නොවූ පිපාසය ඇත්තේ වේද පහ නුවූ දැවිල්ල ඇත්තේ වේද පහ නුවූ තෘෂ්ණාව ඇත්තේ වේද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස, වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් මේ තුන්වෙනි සිත පිලිබඳ බැම්ම නොසිඳින ලද්දේ වේ.

**9.** " මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම කුස පිරෙන තෙක් අනුබව කොට නිදීම් සැපයෙහිද, ඒ මේ අත පෙරලි පෙරලී නිදීම් සැපයෙහිද යෙදී වාසය කෙරේද, මහණෙනි, යම් මේ භික්ෂුවක් කුස පිරෙන තෙක් අනුබව කොට නිදීම් සැපයෙහිද, ඒ මේ අත පෙරලි පෙරලී නිදීම් සැපයෙහිද යෙදී වාසය කෙරේද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස, වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නොනැමෙයි. යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නොනැමේද මෙසේ ඔහු විසින් මේ සතරවෙනි සිත පිලිබඳ බැම්ම නොසිඳින ලද්දේ වේ.

**10.** " මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචරියාවෙන් හෝ මහෙශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමි අල්පේශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමි යි කියා එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනා කරගෙන බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරේ ද, මහණෙනි, යම් ඒ භික්ෂුවක් මම මේ ශීලයෙන් හෝ වතින් හෝ තපසින් හෝ බ්‍රහ්මචරියාවෙන් හෝ මහේශාක්‍ය දෙවියෙක් හෝ අල්පේශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමි යි කියා එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනා කරගෙන බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරේ ද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යකිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යකිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නොකැමෙයි · යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යකිරීම පිණිස එම

වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යකිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නොනැමේ ද මෙසේ ඔහු විසින් සිත පිලිබඳ වූ මේ පස්වැනි බැම්ම නොසිඳින ලද්දේ වේ · ඔහු විසින් මේ පස් වැදෑරුම් බැම් නොසිඳින ලද්දාහු වෙත් .

11 ,මහණෙනි, යම් කිසි භික්ෂුවක් විසින් චෙතොඛිල ධර්‍ම පසද මේ විනිබන්ධ ධර්‍ම පස ද නොසිඳින ලද්දාහුද, ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් මේ ශාසනයෙහි අභිවෘද්ධියට ද වැඩීමට ද මහත් බවට ද පැමිණෙන්නේය යන මේ කාරණය සිදුනොවෙයි

,මහණෙනි, යම්කිසි භික්ෂුවක් විසින් මේ පස් වැදෑරුම් චෙතොඛිල ධර්‍මයෝත් පස් වැදෑරුම් විනිබන්ධ ධර්‍මයෝත් සිඳින ලද්දාහුද ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් මේ ශාසනයෙහි අභිවෘද්ධියට ද වැඩීමට ද මහත්බවටද පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි ඔහු විසින් කවර නම් චෙතොඛිල ධර්‍ම පසක් පහකරන ලද්දාහුද යත් ?

,මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ශාස්තෘන්වහන්සේ කෙරෙහි සැක නොකෙරේ ද, අවිශ්වාස නොකෙරේ ද, නිශ්චයට පැමිණෙ ද පහදී ද, මහණෙනි යම් ඒ භික්ෂුවක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක නොකෙරේ ද අවිශ්වාස නොකෙරේ ද නිශ්චයට පැමිණේ ද පහදීද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යය කිරීම පිණිස, එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස , වීර්‍ය්‍ය ය පිහිටුවීම පිණිස, නැමෙයි · යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය ය පිහිටුවීම පිණිස නැමේ ද, ඔහු විසින් මේ පලමුවැනි චෙතොඛිල ධර්‍මය පහකරණ ලද්දේ වෙයි

,මහණෙනි නැවත අනෙකක් ද කියම් මහණතෙම ධර්‍මයෙහි සැක නොකෙරේ ද අවිශ්වාස නොකෙරේ ද, මෙසේ මෙසේ යයි නිශ්චයට පැමිණේද , පහදීද, මහණෙනි යම් මේ භික්ෂුවක් ධර්‍මයෙහි සැක නොකෙරේ ද, අවිශ්වාස නොකෙරේ ද, මෙසේ මෙසේ යයි නිශ්චයට පැමිණේ ද, පහදීද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යය කිරීම පිණිස , වීර්‍ය්‍යය පිහිටුවීම පිණිස නැමෙයි . යමෙකුගේ සිතකෙලෙසුන් තවන වීර්‍ය්‍යය කිරීමපිණිස, වීර්‍ය්‍යය පිහිටුවීම පිණිස, නැමේ ද මෙසේ ඔහු විසින් මේ දෙවැනි චෙතොඛිල ධර්‍මය පහකරණ ලද්දේ වෙයි.

,මහණෙනි නැවත අනෙකක්ද කියම් . මහණතෙම සංඝයා කෙරෙහිසැක නොකෙරේද, අවිශ්වාස නොකෙරේ ද, මෙසේ මෙසේ යයි නිශ්චයට පැමිණේ ද පහදී ද , මහණෙනි, යම් මේ භික්ෂුවක් සංඝයා කෙරෙහි සැක නොකෙරේ ද, අවිශ්වාස නොකෙරේද, මෙසේ මෙසේ යයි නිශ්චයට පැමිණේ ද පහදී ද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීය්‍යාය කිරීම පිණිස , එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස, නිතර වීර්‍ය්‍යය කිරීම, පිණිස වීර්‍ය්‍යය පිහිටුවීම ,පිණිස නැමෙයි . යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යය කිරීම පිණිස එම වීර්‍ය්‍යය යෙහි නැවත නැවත යෙදීම

පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමේ ද, මෙසේ ඔහු විසින් මේ තුන්වැනි චෙතොඛිල ධර්‍මය පහකරණ ලද්දේ වේ.

**12.** ,මහණෙනි නැවත අනෙකක් ද කියම් ග මහණතෙම ත්‍රිවිධ ශික්ෂාව කෙරෙහි සැක නොකෙරේ ද ල අවිශ්වාස නොකෙරේ ද ල මෙසේ මෙසේ යයි නිශ්වයට පැමිණේ ද පහදී දල මහණෙනි යම් මේ භික්ෂුවක් ත්‍රිවිධ ශික්ෂාව කෙරෙහි සැක නොකෙරේ ද අවිශ්වාස නොකෙරේ දල මෙසේ මෙසේ යයි නිශ්වයට පැමිණේ ද පහදී ද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීය්‍යය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමෙයි ග යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමේ දල මෙසේ ඔහු විසින් මේ සතර වැනි චෙතොඛිල ධර්‍මය පහකරණ ලද්දේ වෙයිග

“මහණෙනි නැවත අනෙකක් ද කියම් . මහණතෙම සබ්‍රම්සරුන් (එකට මහණදම් පුරණ භික්ෂූන් ) කෙරෙහි නොකිපියේ, සතුටුසිත් ඇත්තේ, තරහෙන් නොමඩනා ලද සිත් ඇත්තේ තද ගතියක් නැත්තේ වේ ද , මහණෙනි යම් මේ භික්ෂුවක් සබ්‍රම්සරුන් කෙරෙහි නොකිපියේ සතුටු සිත් ඇත්තේ තරහෙන් නොමඩනා ලද සිත් ඇත්තේ තදගති නැත්තේ වේ ද, ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමෙයි . යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යකිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමේ ද , මෙසේ ඔහු විසින් මේ පස්වන චෙතොඛිල ධර්‍මය පහකරණ ලද්දේ වෙයි. මෙසේ මහු විසින් මේ චෙතොඛිල ධර්‍ම පස පහකරණ ලද්දාහු වෙත්.

**13.** ,ඔහු විසින් කවර නම් සිත පිලිබඳ බැම් පසක් සිඳින ලද්දාහු වෙත් ද ? මහණෙනි, මේ ලෝකයෙහි මහණතෙම කාමයෙහි පහවූ ආශාව ඇත්තේ වේ ද පහවූ කැමැත්ත ඇත්තේ වේ ද පහවූ ප්‍රෙමය ඇත්තේ වේ ද පහවූ පිපාසා ඇත්තේ වේ ද, පහවූ දැවිල්ල ඇත්තේ වේ ද ,පහවූ තෘෂ්ණාව ඇත්තේ වේ ද මහණෙනි යම් මේ භික්ෂුවක් කාමයෙහි පහවූ ආශාව ඇත්තේ වේ ද පහවූ කැමැත්ත ඇත්තේ වේ ද පහවූ ප්‍රේමය ඇත්තේ වේ ද පහවූ පිපාසය ඇත්තේ වේ ද පහවූ දැවිල්ල ඇත්තේ වේ ද පහවූ තෘෂ්ණානාව ඇත්තේ වේ ද ඔහුගේ සිත කෙලෙසුන් තවණ වීර්‍ය්‍ය පිණිස එම වීර්‍ය්‍ය යෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමේ ද මෙසේ ඔහු විසින් සිත පිලිබද වූ මේ පළමුවෙනි විනිබන්ධය මනාකොට සිඳින ලද්දේ වේ .

“මහණෙනි නැවත අනෙකක් ද කියම් . මහණතෙම තමන්ගේ කයෙහි පහවූ ආශාව ඇත්තේ වේ ද පහවූ කැමැත්ත ඇත්තේ වේ ද පහවූ ප්‍රේමය ඇත්තේ වේ ද පහවූ පිපාසය ඇත්තේ වේ ද පහවූ දැවිල්ල ඇත්තේ වේ ද පහවූ තෘෂ්ණාව ඇත්තේ වේ ද මහණෙනි, යම් මේ භික්ෂුවක් තමන්ගේ කයෙහි පහවූ ආශාව ඇත්තේ වේ ද පහවූ කැමැත්ත ඇත්තේ වේ ද පහවූ ප්‍රේමය

ඇත්තේ වේ ද පහවූ පිපාසය ඇත්තේ වේ ද පහවූ දැවිල්ල ඇත්තේ වේ ද පහවූ තෘෂ්ණාව ඇත්තේ වේ ද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණාස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය එහිටුවීම පිණිස නැමෙයි . යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යකිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යකිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමේ ද මෙසේ ඔහු විසින් සිත පිළිබඳ වූ මේ දෙවැනි වූ විනිබන්ධය මනාකොට සිඳින ලද්දේ වේ .

14. ,මහණෙනි නැවත අනෙකක් ද කියමි. මහණතෙම බාහිර වූ රූපයෙහි පහවූ ආශාව ඇත්තේ වේ ද පහවූ කැමැත්ත ඇත්තේ වේ ද පහවූ ප්‍රේමය ඇත්තේ වේ ද පහවූ පිපාසය ඇත්තේවේ ද පහවූ දැවිල්ල ඇත්තේ වේ ද පහවූ තෘෂ්ණාව ඇත්තේ වේ ද මහනෙණි ල යම් ඒ භික්ෂුවක් බාහිර වූ රූපයෙහි පහවූ රාගය ඇත්තේ වේ ද පහවූ කැමැත්ත ඇත්තේ වේ ද පහවූ ප්‍රේමය ඇත්තේ වේ ද පහවූ පිපාසය ඇත්තේ වේ ද පහවූ දැවිල්ල ඇත්තේ වේ ද පහවූ තෘෂ්ණාව ඇත්තේ වේ ද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැවෙයි ග යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමේ දල මෙසේ ඔහු විසින් සිත පිළිබඳ වූ මේ තුන්වැනි විනිබන්ධය මනාකොට සිඳින ලද්දේ වෙයි

' මහණෙනි නැවත අනෙකක් ද කියමි මහණතෙම බඩපුරා අනුභව කොට සයන සැපයෙහි ද ඒ මේ අත පෙරළෙමින් නිදන සැපයෙහි ද නිදි සැපයෙහි ද යෙදී වාසය නොකෙරේ ද මහණෙනිල යම් ඒ භික්ෂුවක් බඩපුරා අනුභව කොට සයන සැපයෙහි ද ඒ මේ අත පෙරළෙමින් නිදන සැපයෙහි ද නිදි සැපයෙහි ද යෙදී සයනය නොකෙරේ ද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමෙයි යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍ය කිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමේ ද මෙසේ ඔහු විසින් සිත පිළිබඳ වූ මේ සතරවැනි විනිබන්ධය මනාකොට සිඳින ලද්දේ වේ

15. ,මහණෙනි නැවත අනිකක් ද කියමි · මහණතෙම මම මේ ශීලයෙන් හෝ මේ වතින් හෝ මේ තපසින් හෝ මේ බ්‍රහ්ම චරියාවෙන් හෝ මහේශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමි ල අල්පේශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමි කියා එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනා කර ගෙන බ්‍රහ්මචර්යාවෙහි නොහැසිරේ ද මහණෙනි යම් ඒ භික්ෂුවක් මම මේ ශීලයෙන් හෝ මේ වතින් හෝ මේ තපසින් හෝ මේ බ්‍රහ්මචරියාවෙන් හෝ මහේශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමි අල්පේශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමියි කියා එක්තරා දිව්‍ය නිකායක් ප්‍රාර්ථනා කරගෙන බ්‍රහ්මචර්යාවෙහි නොහැසිරේ ද ඔහුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යකිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍යකිරීම පිණිස වීර්‍ය්‍ය පිහිටුවීම පිණිස නැමෙයි.යමෙකුගේ සිත කෙලෙසුන් තවන වීර්‍ය්‍යකිරීම පිණිස එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම පිණිස නිතර වීර්‍ය්‍ය කිරීම පිණිස

වීර්‍ය්‍යය පිහිටුවීම පිණිස නැමේ ද මෙසේ ඔහු විසින් සිත පිළිබඳ වූ මේ පස්වැනි වූ විනිබන්ධය මනාකොට සිඳින ලද්දේ වෙයි ඔහු විසින් සිත පිළිබඳ වූ මේ විනිබන්ධ පස මනාකොට සිඳින ලද්දාහු වෙත්

**16.** ,මහණෙනි යම් කිසි භිකෂුවක් විසින් මේ චෙතොඛිල ධර්‍ම පස ද මේ විනිබන්ධ ධර්‍ම පසද සිඳින ලද්දාහු ද ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් මේ ශාසනයෙහි අභිවෘද්ධියටද, වැඩීමට ද නැගීමටද මහත් බවටද පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි ඒ භික්ෂුතෙම ඡන්දය නිසා පැවති සමාධිය ප්‍රධාන කොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ සෘද්ධිපාදය වඩයි · සිත නිසා පැවති සමාධිය ප්‍රධානකොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ සෘද්ධිපාදය වඩයි වීර්‍ය්‍යය නිසා පැවති සමාධිය ප්‍රධා න කොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ සෘද්ධිපාදය වඩයි · වීමංසාව නිසා පැවති සමාධිය ප්‍රධාන කොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ සද්ධිපාදය වඩයි සැම තන්හි කටයුතු වීර්‍ය්‍යයම හෙවත් සියලු කටයුතු සිදුකරණ වීර්‍ය්‍යය ම පස්වැනි කොට ඇත්තේ වේ ද මහණෙනි මෙසේ සියලු අභිවෘද්ධිය සිදුකරන වීර්‍ය්‍යය සහිත පසළොස් අඩගයකින් සමන්විත වූ ඒ මේ භික්ෂුතෙම නුවණින් කෙලෙස් බිඳීමට සුදුසු වේ සතරමාර්ගඥානය අවබොධ කරගැනීමට යෝග්‍යවේ · උතුම් වූ අර්හත් ඵල අවබෝධයට යෝග්‍ය වේ · මහණෙනි යම්සේ කිකිළියගේ බිජුවට අටක් හෝ දහයක් හෝ දොළසක් හෝ වෙත් ද ඒ බිජුවට කිකිළිය විසින් මනාකොට රකින ලද්දාහු උනුසුම් කරණ ලද්දාහු මනාකොට වඩන ලද්දාහු වෙත්ද ඒ කිකිළියට මාගේ කුකුල් පැටව් පයේ නියවලින් හෝ හොටෙන් හෝ සුවසේ බිජයන් බිඳගෙන නික්මෙන්නාහු නම් ඉතා යෙහෙකැයි යන මෙබඳු ආශාවක් නූපදින්නීය · එහෙත් ඒ කුකුල් පැටව් පයේ නියවලින් හෝ හොටෙන් හෝ සුවසේ බිජු බිඳ ගෙන නික්මෙන්නට යෝග්‍යවූවාහු වෙද්ද මහණෙනි එපරිද්දෙන්ම මෙසේ සියලු කටයුතු සිදුකරණ වීර්‍ය්‍යය සහිත පසළොස් අංගයෙන් සමන්විත වූ මහණ තෙම නුවණින් කෙලෙස් බිඳීමට යෝග්‍යය වේ සතර මාර්ගඥානය අවබෝධයට යොග්‍ය වේ · උතුම් වූ අර්හත් ඵලයාගේ අවබෝධයට යෝග්‍ය වේමය ·

භාග්‍යවතුන්වහන්සේ මේ ධර්‍මයවදාළහ · සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්තෝය

‘දහසය වැනිවූ චෙතොඛිල සූත්‍රය නිමි · ( 2– 6 )